


2013 අංක ....... දරණ යෝජිත බීජ සහ රෝපණ ද්‍රව්‍යය පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට රජය සහ බහුජාතික සමාගම් සූදානම් ය. භයානක බව වසන් කිරීමට උත්සාහ දැරුවත්, විපත වටහා ගැනීම ජනතාවගේ අයිතියයි.

ආහාර ජීවයේ පැවැත්මයි. බීජය ආහාර දම්වැලේ මුල් පුරුකයි. වසර දස දහස් ගණනක් ගොවීන් විසින් දේශගුණයට, පසට, පරිසරයට සහ පෝෂණයට ගැලපෙන බීජ සහ රෝපණ ද්‍රව්‍ය හඳුනාගෙන, වැඩි දියුණු කර, ආරක්ෂා කර පවත්වාගනු ලැබී ය. නමුත් පසුගිය සිය වසර තුළ ජීව පරිණාමය, ප්‍රජනනය, ජාන සහ අභිජනනය පිළිබඳ විද්‍යාත්මක දැනුම නිර්මාණය වීමත් සමග බීජ අභිජනනයේ (බෝ කිරීමේ) අයිතිය ගොවීන්ගෙන් 'විද්‍යාඥයන්' සහ විද්‍යාගාර වලට ද, ඉන්පසුව ලාභ ඉපයීමේ උල්පතක් ලෙස පෞද්ගලික/බහුජාතික සමාගම්වල ග්‍රහණයට නතුවෙමින් පවතී. ලෝකයේ බීජ සහ පළිබෝධ නාශක කර්මාන්තය පාලනය කරන්නේ බහුජාතික සමාගම් 10 කි. ඔවුන්ගේ වාර්ෂික අලෙවි ආදායම ඩොලර් මිලියන 60,000 කට අධික ය. එසේ වුවද ලෝකයේ බීජ වර්ග වලින් 75%ක් තවමත් ගොවීන් සතු ය. එම අයිතියට මැදිහත්වී, බීජ බෝ කිරීම, හුවමාරුව, අලෙවිය සහ ආරක්ෂිතව පවත්වාගෙන යාමේ ගොවි අයිතිය උදුරාගෙන, ඒකාධිකාරය සතු කර ගැනීම බහු ජාතික සමාගම්වල අරමුණයි.

දේශීය බීජ (ජාන සම්පත) සහ බීජ නිෂ්පාදන තාක්ෂණයන් අයිතිකර ගැනීමත්, බීජ භාවිතය පිළිබඳ නීති රීති සහ අණපනත් ආණ්ඩු ලවා සම්මත කර ගැනීමත් ඔවුන්ගේ උපාය මාර්ගයයි. එම කටයුත්තට අවශ්‍යය අනුබලයන් ලබා දීමට පරගැති පාලකයන් සහ නිලධාරී ගැත්තන් සහ නියෝජිතයන් ඇප කැප වී සිටී.

**දේශීය බීජ (ජාන සම්පත) සහ බීජ නිෂ්පාදන තාක්ෂණයන් අයිතිකර ගැනීම.**

දෙවන ලෝක යුද්ධ කර්මාන්තයට නිපද වූ යූරියා ඇතුළු රසායනික ද්‍රව්‍ය, කෘෂි කර්මාන්තයට යොදා ගැනීමෙන් රසායනික පොහොර භාවිතය ප්‍රචලිත විය. එයින් දේශීය ප්‍රබේධ, රෝග සහ පළිබෝධ හානියට ගොදුරු විය. 1945 දී එළි දුටු හරිත විප්ලවය - දෙමුහුන් බීජ, රසායනික පොහොර නිසා ඉහළ අස්වැන්නක් ලබා දුනි. නමුත් ඒ සඳහා අධිකව පළිබෝධනාශක සහ ජලයද, යාන්ත්‍රීකරණය ද, මහා පරිමාණ ඒකීය බෝග වගා කිරීම ද, අවශ්‍ය විය. අනිටු ප්‍රතිඵලය වූයේ මෙතෙක් පැවති කෘෂිකාර්මික ජෛව විවිධත්වය (බෝග රාශියක් සත්ත්ව පාලනය සමඟ එකවර පැවතීම) සහ එයින් ජනිත වූ ආහාර සහ පරිසර විවිධත්වය අහිමි වීමත්, පස නිසරු වීම ඇතුළු මහා පරිමාණ පරිසර දූෂණයත්, නිෂ්පාදන වියදම ඉහළ යාමත්, ගොවීන්ගේ ණය ගැති බවත්, මුළු රට ම බහුජාතික සමාගම් සහ ජාත්‍යන්තර බැංකු වල ප්‍රාණ ඇපකාරයන් වීම ය.

පෙර නොඇසූ - නුදුටු රෝග බහුල විය. අද රජරට සිට මුළු වියළි කලාපය වසා පැතිරෙන කෘෂි කාර්මික වකුගඩු රෝගයෙන් පෙළෙන සංඛ්‍යාව 50,000ට අධික ය . දිනපතා 13 දෙනෙක් මිය යති. තත්වය මෙසේ ම පැවැතියහොත් තවත් වසර 10 දී රටෙන් හරි අඩක් වකුගඩු රෝගීන් ය. ආහාර වල වස-විස නිසා පාරිභෝගිකයෝ බියපත්ව අසරණව සිටිති. ඔවුන්ට මිල දී ගැනීමට වස-විස නොයෙදූ ආහාර ඇත්තේ ස්වල්ප ප්‍රමාණයක් පමණි. වස-විස නැති කාබනික ආහාර සඳහා ලෝකයේ ඉල්ලුම වසරකට 25% කින් ඉහළ යයි.

අද බොහෝ ආහාර (බඩ ඉරිඟු, සෝයා, එළවළු , පලතුරු ආදිය) නිපදවන්නේ ඉතා මිල අධික වූ දෙමුහුන් බීජ වලිනි. අධික ලෙස රසායනික පොහොර පළිබෝධ නාශක සහ ජලය යොදා ගැනේ. බරපතල කාරණය නම් මෙම දෙමුහුන් බිජ අස්වැන්න වඳ බිජ වීමයි. ස්වයං වඳ වීමේ ජාන විකෘතිකරණයන් එම බීජ වලට ඇතුළත් කර තිබේ. පරාග මගින්, දේශීය බෝග සහ වල් පැළෑටි වලට මුසු වීමෙන් ඒවා ද වඳ වේ. ආහාරයට ගන්නා සතුන්, කෘමීන්, ක්ෂුද්‍ර ජීවීන් සහ මිනිසාට සිදු වන්නේ කුමක් ද?

සෝයා, බඩ ඉරිඟු, තිරිඟු, කපු, වී, කැනෝලා, තක්කාලි ආදී බෝග රාශියක් අද වගා කරන්නේ ජාන වෙනස් කළ වල් නාශක සහ කෘමි ප්‍රතිවිරෝධී බීජ වලිනි. බීජ නිපදවන සමාගමටම අයත් වල් නාශක (ගලයිපොසේට්) යෙදූ විට බෝගය හැර සෙසු පැළෑටි සියල්ල විනාශ වේ. නමුත් ඉන්පසුව ඔරොත්තු දෙන සුපිරි වල් පැළ බිහි වී පාලනය අසීරු වේ.




බැක්ටීරියාවන්ගේ විස නිපදවෙන ජාන ශාක වලට ඇතුළත් කර කෘමීන්ට විස සහිත පැළෑටි/බීජ නිපදවේ. වගා කළ විට විසට ඔරොත්තු දෙන සුපිරි කෘමීන් වේගයෙන් බිහිවේ. ඔවුන් නැසීමට තව තවත් සැර විස යෙදිය යුතු ය. ආහාරයට ගන්නා මිනිසා ඇතුළු සතුන්, කෘමීන්, ක්ෂුද්‍ර ජීවීන්ට සහ පසට විස සහිත ජාන ඇතුළු විය හැකි ය. පරිසර සහ සෞඛ්‍ය විපාක අවිනිශ්චිත ය.

දෙමුහුන්, වඳ වූ, ජාන විකරණය වූ බීජ, ඒකීය බෝග ලෙස වගා කිරීම නිසා ස්වභාවිකව පවතින සෙසු දේශීය පැළෑටි වඳවී යයි. අතීතයේ දස දහස් ගණනක් ශාක ප්‍රභේද ආහාරයට ගනු ලැබුවත් අද 90% ක් සැපයෙන්නේ බෝග වර්ග 120 කින් පමණ ය. පැළෑටි 12 ක් සහ සත්ව වර්ග 5 ක් සමස්තයෙන් 70% ක් සපයයි. බීජ ඒකාධිකාරය විසින් අලෙවි කරන්නේ අධික ලාභ සහිත, ප්‍රවාහනය කළ හැකි, කල් තබා ගත හැකි කර්මාන්තයට යොදා ගත හැකි බීජ පමණ ය. සෙසු වර්ග විනාශ කර දැමීමට සියලූ උපාය මාර්ගයන් ගැනේ. මිල ඉහළ දැමීම ඉන් පසුව සිදුවේ.

**ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් උපයෝගි කර ගනිමින් බීජ අණ පණත් සෑම රටක ම සම්මත කරවීම බහුජාතික සමාගම්වල දෙවන උපාය මාර්ගය යි.**

- බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලියාපදිංචිය සහ සහතික කිරීම අනිවාර්ය කිරීමත්, ඒ සඳහා වෙළෙඳ කෘෂිකර්මයට ගැලපෙන දැඩි නීති හා රෙගුලාසි පනවා කුඩා ගොවීන් සහ දේශීය නිෂ්පාදකයන්ගේ අයිතියත් අහෝසි කරනු ලැබේ.
- දෙමුහුන් බීජ අභිජනනය සහ ජාන විකරණ තාක්ෂණයන් ද, පැළෑටි සහ පැළෑටි කොටස් ද, බුද්ධිමය දේපළ ලෙස සමාගම් ඒකාධිකාරයට යටත් කරගනු ලැබේ. ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් යටතේ අණ පනත් සම්මත කරවා එම බීජ අලෙවිය ද, වටිනා ජාන සම්පත් ද, බහුජාතික සමාගම් වලට ලබා දෙන ලෙසට බල කරනු ලැබේ. දේශපාලන පීඩනය, ණය සහ ආධාර ද, අල්ලස් සහ කොමිස් යනාදිය ද, එයට යොදා ගැනේ.
- බුද්ධිමය දේපලට යටත් වූ බීජ වගා කිරීම, බෝ කිරීම, නිෂ්පාදන සැකසීම, පර්යේෂණ සඳහා සමාගම් වලට බදු ගෙවිය යුතු ය. පර්යේෂණ සඳහා අවසර දීමේ අභිමතය ද ඔවුන් සතු ය. බුද්ධිමය දේපලට යටත් ජෛව සම්පත ද, (පැළෑටියක් ම, සත්ත්වයෙක් ම,) එයින් සිදු කරන නිෂ්පාදන ද, සමාගමේ බුද්ධිමය දේපල වේ. දේශීය වගාවකට ස්වභාවිකව විකරණය වූ ජාන මුසු වුවහොත් වැරදිකරු ගොවියා ය. දඩ මුදල්/දඬුවම් බරපතල ය.
- ජාන සම්පත් මංකොල්ල කෑමට පහසු වන සේ ආණ්ඩු ලවා නීති සහ උපක්‍රම සම්පාදනය කරවනු ලැබේ. ඒ අනුව ජාන සම්පතේ සංරක්ෂණ ඒකාධිකාරය රජය සතු කෙරේ. බැලූ බැල්මට ඉතා යහපත් ය. නමුත් රුස් කර ගබඩා කරගත් පසුව, ජාන සම්පත අන්තර්ජාතික මංකොල්ලකරුවන්ට විකුණා දැමීමට, මුදලට කෑදර, කුට දේශපාලඥයන්ට සහ කපටි නිලධාරීන්ට ඉතා පහසු ය. එවැනි අත්දැකීම් ලෝකයේ පවතී.

**යෝජිත 2013 අංක .... බීජ හා රෝපණ ද්‍රව්‍ය පණත් කෙටුම්පතෙහි රෙගුලාසි ඉහත උවමනාවන් සපුරාලයි.**

- පෞද්ගලික අංශයේ බීජ කර්මාන්තයට රාජ්‍ය අනුග්‍රහය, මුදල් සහ මානව සම්පත්, ලබා දී අයිතිවාසිකම් තහවුරු කෙරේ.
- බීජ අපනයනය කරන රටේ 'නිල පිළිවෙතට' අනුකූල නම්, බීජ ආනයනයට අවසර ලැබේ.
- ජාන වෙනස් කරන ලද බීජ වල ප්‍රමිතිය විනිශ්චය කරණු ලැබේ. කෘෂි ක්ෂේත්‍රවලට අදාල බෝගවල ජාන විකිරණයට සහ අනෙකුත් නවීන විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අදාල සම්මතයන් සහ ප්‍රමිතීන් විනිශ්චය කිරීමට, හඳුනාගැනීමට, පහසුකම් සැලසේ (ඒ අනුව එම බීජ රට තුළ ට පැමිණේ).
- ගොවීන් ඇතුළු සියලු බීජ නිෂ්පාදකයන් නියමිත කොන්දේසි යටතේ ලියාපදිංචි විය යුතු ය. බීජ සහතික කරගත යුතු ය.
- ගොවීන් අතර හෝ ගොවි සංවිධානවලට හෝ සහතික කිරීමෙන් තොරව බීජ හුවමාරුව/විකිණීම, ගබඩා කිරීම තහනම් ය.
- ජාන සම්පත සංරක්ෂණයේ අනන්‍ය වූ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් සතු ය.
- අපරාධ නඩු විධි විධාන යටතේ නිලධාරීන්ට පොලිස් බලතල පැවරේ.
- වැරදි වලට දඬුවම මාස 06 ක සිරදඬුවම් සහ රු: 50,000 ක දඩයකි. දෙවන තුන්වන වරට දඬුවම දෙගුණ හා තෙගුණ වේ. අනාගතයේ දී, පනවනු ලබන නියෝග වලට එරෙහි වීම ද, දඬුවම් ලැබිය යුතු වරදකි.

**මේ අනුව බීජ පනතට එරෙහි වීම ගොවීන්ගේ මෙන් ම සියලු පාරිභෝගිකයන්ගේ වගකීමකි. අයිතියකි. එබැවින් අප ඉල්ලා සිටින්නේ මෙම විනාශකාරී, මර්දනකාරී පනත පරාජය කිරීමට සංවිධානය වන ලෙස ය.**

---

▸▸බීජ පනත ▸▸බීජ පනත විග්‍රහය ▸▸බීජ නිදහස සඳහා ජාත්‍යන්තර ව්‍යාපාරය ▸▸විකල්ප බීජ ප්‍රතිපත්තිය
▸▸ජාන මංකොල්ලය ▸▸ජාන විකෘතිකරණය ▸▸ගොවි සහභාගිත්ව බීජ/ශාක අභිජනනය ▸▸ප්‍රජා බීජ බැංකු
▸▸ජෛව විවිධත්වය සහ බීජ ස්වාධීනත්වය ▸▸බහු ජාතික බීජ මංකොල්ලකරුවන් ▸▸බීජ ඒකාධිකාරය

**යනා දී මාතෘකා රැසක් යටතේ ඔබ තව තවත් දැනුම්වත් කිරීමට අප සූදානම්.**

**අමතන්න, චින්තක රාජපක්ෂ 072 4640187/076 6568663, උපාලි ලෙව්ලියද්ද 072 1382892,**
**එම්. මුසම්මිල් 077 6062916**

# බීජ අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරය

**කැඳවුම්කරු, පූජ්‍ය මහමාන්කඩවල පියරතන නායක ස්ථවිර,**
**උතුරු සහ උතුරු මැද දෙදිසාවේ ද්විතීය සංඝනායක,**
**බෙත්තාරාම පුරාණ විහාරය. එප්පාවල,**
**දුරකතන අංකය : 025 2249387**
**විද්‍යුත් තැපැල් ලිපිනය :** eppawalacampaigne@gmail.com

---

**කොළඹ මෙහෙයුම් කාර්යාලය,**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය,**
**අංක: 12/83, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය.**
**දුරකතන අංක : 011 2886747**
**විද්‍යුත් තැපැල් ලිපිනය :** monlar@sltnet.lk